**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 06 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 14 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාවට 2016,2017,2018 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු මුද්දර බදු ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම නිවැරදිව ලේඛනවල සහ ගිණුම්වල දැක්විය යුතු වේ. | ඉඩම් හා රෙජිස්ටාර් කාර්යාලය මගින් 2016,2017,2018 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම මේවන විට ලබා ගෙන ඇත. ඒ අනුව 2019 වර්ෂය සඳහා නිවරදිව ගිණුම් ගත කිරිමට කටයුතු කරමි. |
| (ii) | 2017 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබු රු. 125,580 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මුදල් වර්ෂයට අදාල ගෙවීය යුතු සියළුම වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුවේ.පූර්ව වර්ෂවලට අදාල වියදම් නිවැරදිව ගිණුම්වල ගැලපීය යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) | 2018 ජනවාරි 01 දිනට පැවති විවිධ ණය හිමියන් ශේෂය රු.190,142 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කිරීමේදි | බැරකම් පියවීම සහ වියදම් සඳහා ගෙවීම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත | පිළිගතිමි. විවිධ ණය හිමියන් ගිණුම්ගත කිරීමේදී ජර්නල් සටහන් |

| | | | |
|---|---|---|---|
| | 2018 වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි. | කළයුතු වේ. | යෙදීමේදී වැරදීමක් සිදුවූ අතර, එම වටිනාකම් නිවැරදි කිරිමට කටයුතු කර ඇත. |
| (iv) | 2017 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ගෙවිය යුතුව පැවති කර්මාන්ත ණය හිමි ශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබුණු රු.17,122,234 ක් 2018 වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | බැරකම් පියවීම සහ වියදම් සඳහා ගෙවීම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිගතිමි. කර්මාන්ත ණය හිමියන් ගිණුම්ගත කිරීමේදී ජර්නල් සටහන් යෙදීමේදී වැරදීමක් සිදුවූ අතර, එම වටිනාකම් නිවැරදි කිරිමට කටයුතු කර ඇත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 04 කට අදාලව ගිණුමේ දක්වා තිබූ ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.1,342,371 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | නොගෙවූ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 2018 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.765,847 වුවත් ශේෂ පත්‍රයේ එය රු. 748,780 ක් ලෙස 17,067 අඩුවෙන් දක්වා තිබුණි. | නොගෙවූ වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | පිළිගතිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 02 ක ශේෂය රු.5,700,452 ක් වුවද ලේඛන අනුව ආදායම රු.5,651,767 ක් වූයෙන් රු.48,685 වෙනසක් විය. | මුදල් වර්ෂයට අදාල ආදායම නිවැරදිව ලේඛනවල සහ ගිණුම්වල දැක්විය යුතු වේ. | ආදායම් ලේඛනගත කිරීමේදී මෙම අඩුපාඩුව සිදුවී ඇත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 8 ක් ඉක්මවූ කාලයක සිට අය නොවෙමින් පවතින රු.375,738 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙම ශේෂ හඳුනාගෙන තිබුණද 2018 වර්ෂයේ නිරවුල් කිරීමට අපොහොසත් විය. 2019 වර්ෂයේ නිවැරදි කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 08 ක් ඉක්මවූ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවති එමින් තිබුණු රු.725,020 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | මෙම ශේෂ හදුනාගෙන තිබුණද 2018 වර්ෂයේ නිරවුල් කිරීමට අපොහොසත් විය. 2019 වර්ෂයේ නිවරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.6,771,447 ක්වූ ගිණුම් විෂයයන් 05 කට අදාලව වයස් විශ්ලේෂණ, විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | අවශ්‍ය උපලේඛන නිසි පරිදි සකස් කිරීමට විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 203 අධිකාරිය | සභාව සතු ට්‍රැක්ටර් 02 ක් සහ ටේලරයක් ලියාපදිංචි කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එම වාහන ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස විෂය නිලධාරීන්ට උපදෙස් දුනිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ.1647(ඉ) | සභාව සතු වාහන සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. | මුරෙ 1649 අනුව වාහන සම්බන්ධ ලේඛනයක් පවත්වා ගැනිමට විෂයභාර නිලධාරිට උපදෙස් ලබා දුනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| i. | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරිම හා අතිකාල හා නිවාඩු දින සේවා කිරීමේදි එම චක්‍රලේඛය ප්‍රකාරව සේවය කරන ලද පැය තීරණය කිරිම සිදු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන මේ වන විට සලසා ඇත. |
| ii. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක30/2016 චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන සම්බන්ධව ඉන්ධන දහන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | අදාල වාහන 07 හි ඉන්ධන පරික්ෂාව සිදු කිරීමට විෂය නිලධාරි දැනුවත් කළෙමි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක ,උපාංග හා මෘදුකාංග පිළිබද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ උපලේඛනයක් පවත්වා ගැනීමට විෂය නිලධාරි දැනුවත් කළෙමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,355,178 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,694,977 ක් විය.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,722,112 | 1,856,994 | 1,442,851 | 1,381,358 | 971,520 | 1,735,413 | 1,405,666 | 967,015 |
| (ii) | කුලී | 8,696,221 | 7,011,975 | 7,240,204 | 1,264,387 | 7,616,577 | 7,306,058 | 7,059,845 | 1,492,616 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 3,802,500 | 2,816,330 | 2,816,330 | 276,781 | 2,622,500 | 3,495,141 | 3,495,141 | 276,781 |
| (iv) | වෙනත් ආදායම් | 9,230,500 | 5,092,868 | 3,092,852 | 4,023,416 | 7,528,000 | 5,785,303 | 6,755,440 | 2,023,400 |
| | | 23,451,333 | 16,778,167 | 14,592,237 | 6,945,942 | 18,738,597 | 18,322,015 | 18,716,092 | 4,759,812 |

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිග ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම් බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2.2.2 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්කාරව දියුණුකල ප්‍රදේශ ප්‍රකාශයට පත්කර ගැසට් නිවේදන පල නොකරමින් වරිපනම් අයකිරීම සිදුකර තිබුණු බව අනාවරණය වු අතර මෙම නිසා හිගව පවතින රු.1,381,358 ක වරිපනම් බදු ප්‍රමාණය සම්බන්ධව මූල්‍ය හා පරිපාලන රීති 32 සිට 42 දක්වා රීති ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම සහ හිඟ ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිලිගනිමි. වර්ෂයේ ආදායම් වලින් 60% අයකර ගත් අතර වර්ෂයේ හිඟ මුදල හා පෙර වර්ෂවල හිඟ සම්බන්ධයෙන් කටයුතු කිරිම සඳහා ජංගම සේවාවක් පවත්වා හෝ අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 කුලී

----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු මස්කඩ,මාළු ලැලි, රථගාල් බදුදීම මත සභාව වෙත 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයවිය යුතු හිග මුදල රු.903,138 ක් අයකර ගෙන නොතිබුණි. | අයනොවෙමින් පවතින හිඟ ආදායම් අයකර ගැනිමට නෛතික පියවර අනුගමනය කළයුතු වේ. | මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී හිඟ මුදල් ගෙවීමට දැනුවත් කර, සමත මණ්ඩලයට යොමු කර යම් යම් අයගෙන් කොටස් වශයෙන් හිඟ මුදල් අයකලද, තවදුරටත් හිඟව පවතින ශේෂයන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016,2017,2018 වර්ෂවලට අදාලව සභාව වෙත අයවිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර අයකර ගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු ආදායම් නිවැරදිව ගණනය කර ප්‍රේෂණය කරවා ගැනිමට කටයුතු කළයුතු වේ. | මේ වන විට 2016.,2017,2018 වර්ෂ සඳහා අයවිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ උපලේඛන ලබාගෙන ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබද කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබදව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරිම සදහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2018 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කළයුතුවේ. | අතුරු ව්‍යවස්ථා සම්බන්ධ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට විෂයභාර නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදි |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව වර්ෂය ඉටුකිරීමට සැලසුම් කළ ක්‍රියාකාරකම් 11 ක් අතුරින් ක්‍රියාකාරකම් 07 ක් ඉටුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ශක්තිය හා ප්‍රතිපාදනවලට අනුකූල වන ලෙස ක්‍රියාකාරි සැලැස්ම සකස් කළයුතවේ. | ක්‍රියාකාරි සැලැස්ම අනුව සැලසුම් ව්‍යාපෘති කිහිපයක් ඉටුකලද සභාව සතු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ඉතිරි ව්‍යාපෘති කිරීමට නොහැකි විය. |

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබුණු රු.100,000 ක මහකිරිමැටියාව සුගුනාරාමයේ ඉදිරි සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි | එක් එක් වර්ෂයට අදාල ව්‍යාපෘතිය අදාල වර්ෂය තුලදීම නිම කරවා ගැනිමට කටයුතු කළයුතුවේ. | මෙම ව්‍යාපෘතියේ ගැටලුකාරි තත්වයක් පැවතිම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වු අතර එය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙතද දැනුම් දි ඇත. එම ව්‍යාපෘතිය අවසන් කිරිමට අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණූ සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි | චක්‍ර ලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී තිරසර සංවර්ධන අරමුණූ ඉටුකර ගැනිමට විෂය නිලධාරීන් දැනුවත් කලෙමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස්දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමේ තනතුරු 4 ක පුරප්පාඩු 08ක් ද ද්විතියික මට්ටමේ තනතුරු 3 ක පුරප්පාඩු 04ක් ද පැවති අතර අනියම් සේවයන් 04 දෙනෙකු ද බඳවා ගෙන තිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනිමට කටයුතු කළයුතු වේ. | පිළිගතිමි |

3.3 නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු බස් නැවතුම්පල අංක 04 කඩ කාමරය 2017 දෙසැම්බර් මාසයේ සිට නිශ්කාර්යව පැවතුණි. | අඩුපාඩු සම්පූර්ණ කර කඩිනමින් බඳුදීමට කටයුතු කළයුතු වේ. එසේ නොමැතිනම් සභාවේ කාර්යයන් සඳහා භාවිතා කළයුතු වේ. | මෙම කඩකාමරය ටෙන්ඩර් කලද ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් නොවූයෙන් එම කඩකාමරය නිෂ්කාර්යව පවතී. ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට හෝ සභාවේ කාර්යයන් සඳහා යොදා ගැනිමට කටයුතු කරමි. |

3.4 ප්‍රසම්පාදනය
---------------
ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2018 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නොතිබුණ අතර 2019 වර්ෂය වෙනුවෙන් සකසා ඇත. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------
විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම
-----------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(I) දරන මුදල් කළමණාකරන හා විගණන චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී විගණන හා කලමණාකරණ කමිටු පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීමට විෂය නිලධාරි දැනුවත් කළෙමි. |